# රැකියා ඇබෑර්තු

# අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බස්නාහිර පළාත)

**රසායනාගාර භාර නිලධාරී - (දෛනික පදනම) සේවාව ලබාගැනීම**

**අලෙවිකරණ නිලධාරී - (දෛනික පදනම) සේවාව ලබාගැනීම**

**යාන්ත්‍රික කාර්මික නිලධාරී - (දෛනික පදනම) සේවාව ලබාගැනීම**

බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන කරදියාන මිහිසරු සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ අලෙවිකරණ නිලධාරී තනතුර සහ අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන කරදියාන දියර පොහොර නිශ්පාදන කම්හලේ (මත්ස්‍ය අපද්‍රව්‍යවලින්) රසායනාගාරය පවත්වාගෙන යාම සඳහා රසායනාගාර භාර නිලධාරී තනතුර සඳහා සහ යාන්ත්‍රික කාර්මික නිලධාරී තනතුර සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| **තනතුර** | **:-** | **රසායනාගාර භාර නිලධාරී** |
| දෛනික වේතනය | :- | රු. 2,680/-<br>ජීවන වියදම් දීමනාව + විශේෂ දීමනාව රු.5,000/- |
| අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද | :- | කෘෂි විද්‍යාවේදී උපාධිය හෝ කෘෂි ආශ්‍රිත ක්ෂේත්‍රයේ උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ වසර 2ක සේවා පළපුරුද්ද රසායනික විශ්ලේෂනය හෝ ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ රසායනාගාරයක සේවා පළපුරුද්ද විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ. |
| **තනතුර** | **:-** | **අලෙවිකරණ නිලධාරී** |
| දෛනික වේතනය | :- | රු.1,870/-<br>ජීවන වියදම් දීමනාව + විශේෂ දීමනාව රු.5000/- |
| අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද | :- | අලෙවිකරණය සම්බන්ධයෙන් උපාධියක් හෝ කොළඹ කාර්මික විද්‍යාලයේ අලෙවිකරණ පාඨමාලාවක් හදාරා තිබීම සහ වසර 02 ක අලෙවිකරණය සම්බන්ධයෙන් පළපුරුද්ද |
| **තනතුර** | **:-** | **යාන්ත්‍රික කාර්මික නිලධාරී** |
| දෛනික වේතනය | :- | සාකච්ඡා කර තිරණය කෙරේ |
| අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද | :- | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමග සමත් වී තිබීම. (මින් විෂයන් පහ (05) ක් එකවර සමත් විය යුතුය.) අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා ගෙන තිබීම හා අවම අවශයෙන් අදාළ ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. |

**වෙනත් කරුණු :-**

1. සේවාවක් ලබා ගැනීමකි.
2. සේවාව ලබාදෙනු ලබන අයදුම්කරුවන්ගේ දෛනික දීමනාවෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදල සඳහා ඔවුන් විසින් ගෙවිය යුතු අතර, (15% ක් සේවක අර්ථසාධක අරමුදල සඳහා ද, 3% ක් සේවා නියුක්ත භාර අරමුදල සඳහාද ) අධිකාරිය විසින් දරනු ලබයි.
3. සේවාව ලබාදෙනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහය, බස්නාහිර පළාත් මූල්‍ය රෙගුලාසි, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග, ශ්‍රී ලංකා රජය විසින් හෝ බස්නාහිර පළාත් සභාව විසින් පනවා ඇති හෝ විටින් විට පනවනු ලබන නියෝග හා රෙගුලාසිවලට අවනත විය යුතුය.

සේවාව ලබා ගැනීමේ ක්‍රමය :- අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ සභාපති විසින් කැඳවනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ. සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත්, නිසි පරිදි සම්පූර්ණ නොකළ අයදුම්පත් හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයදුම්පත ලැබුණු බව හෝ ප්‍රතික්ෂේප කළ බව දන්වා එවනු නොලැබේ.

ඉල්ලුම් කළ යුතු පිළිවෙල :- සිය විස්තර ඇතුළත් කරමින් ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත්‍ර 2025/08/14 වන දිනට හෝ ඊට පෙර, **අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බ.ප.), තුම්බෝවිල, කරදියාන, පිළියන්දල** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගීවීම වෙනුවෙන් කිසිදු දීමනාවක් ගෙවීමට කටයුතු කරනු නොලබන අතර, කිසිදු අයුරකින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩල තීරණයට බලපෑම් කිරීම එම තනතුර ලැබීමට නුසුදුසුකමක් සේ සලකනු ලැබේ.

බස්නාහිර පළාත තුළ පදිංචි අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**සභාපති,**
**අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බ.ප.)**
**2025.07.21**